බඳවා ගැනීම් සඳහා පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම

බලාත්මක දිනය: 2024.03.20

බඳවා ගැනීමේ සහ තෝරාගැනීමේ ක්‍රියාවලියේදී ලංකා බැංකුව ඔබගේ පෞද්ගලික දත්ත හසුරුවන ආකාරය මෙම දැන්වීමෙන් විස්තර කෙරේ.

1. බැංකුව විසින් ඔබ සම්බන්ධයෙන් රැස්කරනු ලබන පෞද්ගලික තොරතුරු මොනවාද?

(මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා බැංකුව විසින්, බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී ඔබ සම්බන්ධයෙන් පහත සඳහන් පෞද්ගලික තොරතුරු රැස්කිරීම, භාවිතකිරීම හා සැකසීම කරනු ලැබේ;

- පවුලේ නම, මුල් නම, මැද නම, උපන් දිනය, සම්බන්ධ කරගැනීමේ තොරතුරු, ලිපි හුවමාරු ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය, දුරකථන අංකය යනාදිය.
- අයදුම්පතට අදාළ තොරතුරු (අදාළ රැකියා පුරප්පාඩු දැන්වීම අනුව වෙනස් විය හැකි නමුත් සාමාන්‍යයෙන් වෘත්තිය පළපුරුදු, අධ්‍යාපන සුදුසුකම්, භාෂා කුසලතා, අයදුම්කරු පිළිබඳ සහතිකවන්නන්, වෘත්තිය සාමාජිකත්වයන් ඇතුළත් වේ),
- හඳුනාගැනීමේ ලේඛන (හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍රය) සහ රියදුරු බලපත්‍රය
- පෙර සේවායෝජක අවසරය සහ සේවා පළපුරුද්ද, චරිතය පිළිබඳ සහතිකවන්නන්
- මූල්‍ය තොරතුරු, වෛද්‍ය පරීක්ෂණයේ ප්‍රතිඵලය/සෞඛ්‍ය දත්ත (අනිවාර්යයයෙන් සිදුකරනු ලබන වෛද්‍ය පරීක්ෂණයක් හරහා හෙළිදරව් වේ) හා කිසිදු අපරාධ ඉතිහාසයක් නොමැති බවට වාර්තාවක් නොමැති බවට අදාළ බලධාරීන්ගෙන් තහවුරු කිරීමක්.

2. පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණ හා නෛතික පදනම

රැකියා පුරප්පාඩු දැන්වීමක හෝ පුරප්පාඩුවට අදාළ වෙනත් ලිපිලේඛනයක විස්තර කර ඇති පරිදි බැංකුවේ තනතුරක් සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා, බැංකුව විසින්, තෝරාගැනීමේ හා බඳවා ගැනීමේ ක්‍රියාවලිය පුරාම පෞද්ගලික දත්ත සැකසීමට නියම කෙරේ.

ඔබේ ව්‍යවස්ථාපිත අයිතීන්ට අනුකූලවීම සහතික කිරීම, ඵලදායී මානව සම්පත් කළමනාකරණය හා ව්‍යාපාර පරිපාලනය සහතික කිරීම සහ භව්‍ය නෛතික හිමිකම් ස්ථාපිත කර, ක්‍රියාත්මක කිරීමට

හෝ ආරක්ෂා කිරීමට මෙන්ම ව්‍යවස්ථාපිත සහ/හෝ නියාමන අවශ්‍යතා හා බැඳීම්වලට අනුකූල වීමට බැංකුවට හැකියාව ලබා දීම සඳහා පෞද්ගලික දත්ත සැකසීම තවදුරටත් අවශ්‍ය වේ.

3. බැංකුව විසින් ඔබේ පෞද්ගලික තොරතුරු රැස් කර ගබඩා කරන්නේ කෙසේද?

බැංකුව විසින් ඔබේ තොරතුරු බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී සෘජුවම ඔබෙන් හෝ සමහර විට රැකියා/බඳවාගැනීමේ ආයතනයක්, නිර්දේශකයන් සහ කලින් කරන ලද රැකියා ස්ථානය වැනි තුන්වන පාර්ශවයකින් රැස් කරයි.

තේරීම් මණ්ඩලයෙන්/ මණ්ඩල සාමාජිකයන්ගෙන්/ කමිටු සාමාජිකයන්ගෙන් සහ වෛද්‍ය සේවා හා ශ්‍රී ලංකා පොලිසිය වැනි බාහිර ආයතන/අධිකාරීන්ගෙන් (අදාළ වේ නම්) පෞද්ගලික දත්ත රැස් කළ හැකිය.

ඔබගේ අයදුම්පතේ ඇති දත්ත ඇතුළු පෞද්ගලික තොරතුරු විවිධ ස්ථානවල, එනම්, බැංකුවේ මානව සම්පත් කළමනාකරණ පද්ධතියේ, බැංකුවේ අනෙකුත් තොරතුරු තාක්ෂණ පද්ධතිවල සහ විද්‍යුත් තැපැල් පද්ධතියේ ගබඩා කර තැබේ.

4. ඔබේ පෞද්ගලික තොරතුරු වෙත ප්‍රවේශ විය හැක්කේ කාටද?

බැංකුවේ මානව සම්පත් දෙපාර්තමේන්තුවේ සාමාජිකයන්, සම්මුඛ පරීක්ෂණ සඳහා නම් කරන ලද මණ්ඩලයේ සාමාජිකයන්, පුරප්පාඩුව පවතින දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් හා ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ සේවාව අවශ්‍ය වන තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය ඇතුළු බඳවාගැනීමේ සහ තෝරාගැනීමේ කාර්යයන් සඳහා ඔබේ පෞද්ගලික තොරතුරු බැංකුව තුළ අභ්‍යන්තරව හුවමාරු වනු ඇත.

බැංකුව ඔබේ පෞද්ගලික තොරතුරු පහත දැක්වෙන තුන්වන පාර්ශවයන් (හා ඔවුන්ගේ නම් කරන ලද නියෝජිතයන්) සමග ද හුවමාරු කර ගනී:

- තේරීම් විභාග පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ විභාග දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් බාහිර සංවිධාන
- රැකියාවේ නියුක්තවීමට පෙර සිදුකරන සෞඛ්‍ය පරීක්ෂාවන් පැවැත්වීමට හා අපරාධ වාර්තා පරීක්ෂණයක් ලබාගැනීම සඳහා බාහිර සංවිධාන
- අධ්‍යාපන ආයතන හා වෘත්තීය සුදුසුකම් සඳහා ස්ථාපිත ආයතන

- කලින් සේවය කළ සේවායෝජකයන්ගේ සහතික කිරීම් සහ හෝ තහවුරුකිරීම් ලබා ගැනීම සඳහා
- රැකියාවට අදාළ රාජකාරි ඉටු කිරීමේදී නීතිඥයන් හා බදු උපදේශකයන් වැනි වෘත්තිය උපදේශකවරුන්
- එවැනි තොරතුරු හෙළිකිරීමට නීතියෙන් නියම කළ විට හෝ පවතින නීතිවලට අනුකූලවීමේ අවශ්‍යතාවක් ලෙස

5. ඔබේ පෞද්ගලික තොරතුරු බැංකුවේ තබාගන්නා කාල සීමාව

ඔබේ පෞද්ගලික තොරතුරු රැස්කර සකස් කිරීමේ කාර්යයන් ඉටුවන තෙක් පමණක් බැංකුව විසින් ඒවා රඳවා ගනු ලැබේ.

පුරප්පාඩුව සඳහා ඔබේ අයදුම්පත තෝරා නොගතහොත්, ඔබේ තොරතුරු තබා ගැනීමට විශේෂ හේතුවක්/නීතිමය හේතුවක් නොමැති නම්, අදාළ බඳවාගැනීමේ ක්‍රියාවලිය අවසන්වීමෙන් පසු වසර දොළහක කාලයක් සඳහා බැංකුව විසින් සාමාන්‍යයෙන් ඔබේ පෞද්ගලික තොරතුරු රඳවා ගනුලැබේ.

පුරප්පාඩුව සඳහා ඔබේ අයදුම්පත තෝරාගන්නේ නම්, පවතින නීතිවලට අනුව, බඳවාගැනීමේ ක්‍රියාවලියේදී රැස්කරන ලද පෞද්ගලික තොරතුරු, ඔබේ සේවා කාලයෙන් පසුව පවා රඳවා ගනු ඇත.

6. රහස්‍යභාවය

4 වන කරුණට යටත්ව, බැංකුව විසින් ඔබේ පෞද්ගලික තොරතුරුවල දැඩි රහස්‍යභාවය ආරක්ෂාකරනු ලැබේ. අයදුම්කරුවන් විසින් හුවමාරුකරන ඕනෑම පෞද්ගලික තොරතුරක් උපරිමයෙන් ආරක්ෂා කරනු ලබන අතර බඳවා ගැනීමේ කාර්යයන් සඳහා පමණක් භාවිතකරනු ලැබේ.

7. දත්ත ආරක්ෂණය

පවතින දත්ත ආරක්ෂණ නීති හා රෙගුලාසිවලට අප අනුකූල වන අතර බඳවාගැනීමේ ක්‍රියාවලියේදී රැස්කරන ලද පෞද්ගලික දත්ත, අපගේ රහස්‍යතා ප්‍රතිපත්තියට හා අදාළ නීතිවලට අනුකූලව හසුරුවනු ලැබේ.

8. සම්බන්ධ කරගැනීමේ තොරතුරු

වැඩිදුර විස්තර හෝ සහාය ලබාගැනීම සඳහා, ඔබට dpo@boc.lk යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ විය හැකිය.

දත්ත ආරක්ෂණ නිලධාරී,
11 වන මහල
ලංකා බැංකුව
අංක 1, ලංකා බැංකු චතුරශ්‍රය,
ලංකා බැංකු මාවත,
කොළඹ 01.

යන ලිපිනයට ඔබගේ ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය.

ඔබේ ගැටළු නිසි ලෙස කඩිනම්න් විසඳාලීමට අප කැපවෙන අතර ක්‍රියාවලිය පුරාවට ඔබට අපගේ සහයෝගය ලැබෙනු ඇත.

2024.03.19 වන දින අවසන් වරට යාවත්කාලීන කරන ලදී.